# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාව පිටු දැකීම සඳහා ස්වයං රැකියා දායකත්වය (ඇඹිලිපිය ප්‍රදේශය ඇසුරින්)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*එස්.ඩී.කේ ශමිෂ්මිලා*[1][1]
*උපාලි හෙට්ටිආරච්චි*[2]

සංක්ෂේපය

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ග්‍රාමීය දරිද්‍රතාව පිටු දකිමින් ග්‍රාමීය ආර්ථික සංවර්ධනයක් ඇත් කර ගැනීම සඳහා සඳහා අවශ්‍ය කරන මූලික ක්‍රියා මාර්ග කෙරේ වැඩි අවධානයක් යොමු කර තිබේ.ග්‍රාමීය ජනතාව දුප්පත් කමින් පෙළෙනුයේ තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට තරම් ප්‍රමාණවත් ආකාරයේ ආදායමක් ලැබෙන ආදායම් උත්පාදන මාර්ගයක් නොමැතිකමිණි. වර්තමානයේ ස්වයං රැකියා ග්‍රාමීය අංශය තුළ ව්‍යප්තව පවති. ග්‍රාමීය දරිද්‍රතාව පිටුදැකීම සඳහා ස්වයං රැකියා මගින් ලැබෙන දායකත්වය පිළිබඳව සිදු කරන ලද මෙය අධ්‍යනය මගින් අපේක්ෂා කරනු ලැබුවේ ග්‍රාමීය දරිද්‍රතාවය පිටු දැකීම සඳහා ස්වයං රැකියා මගින් දායකත්වයක් ලැබේද යන්න හඳුනා ගැනීම අධ්‍යයනය කිරීමත් ස්වයං රැකියා ලාභීන්ගේ පවුලේ සමාජ ආර්ථික තොරතුරු පිළිබඳ අධ්‍යනය කිරීමත්ය. ඒ සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරි වසම් අතරින් පවුල් 50 ක නියදියක් තෝරාගෙන ඇත. අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත මත පදනම් වේ. ප්‍රාථමික දත්ත ප්‍රශ්නාවලියක් භාවිත කරමින් රැස්කළ අතර, ද්විතියික දත්ත මේ සම්බන්ධව ලියැවී ඇති පොත් පත් මගින් හා අනෙකුත් සඟරා ආදියෙන් ලබා ගන්නා ලදි.එකී ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමය ඔස්සේ විග්‍රහ කරන ලදි. අධ්‍යයන ප්‍රතිඵල වලට අනුව පැහැදිලි වන ආකාරයට ස්වයං රැකියාව, ස්වයං රැකියා ලාභීන්ගේ ජීවන තත්වය උසස් තැනකට රැගෙන ඒමට දායකත්වයක් සපයා තිබේ.පවුලේ පැවති ත්ත්වයේ වෙනසක් මේ තුළින් සිදු වී ඇත. ස්වයං රැකියා ලාභී සෑම පවුලක්ම කිසියම් හෝ ආකාරයක වර්ධනයක් මේ හරහා ලබා ඇත.ග්‍රාමීය ප්‍රදේශය තුළ ව්‍යප්තව ඇති ස්වයං රැකියා ප්‍රමාණය වසරින් වසර ඉහළ යන බව සමීක්ෂණ තොරතුරු ඇසුරින් අණාවරණය කරගත හැකි විය. රැකියා ප්‍රමාණයේ වර්ධනය තුළින් ඔවුන්ගේ පවුලේ ආර්ථික තත්වය ඉහළ යාමක් සිදුවන අතර ඒ හේතු කරගෙන ග්‍රාමීය දරිද්‍රතාවයද අවම කර ගැනීමේ මාර්ගයක් බවට ස්වයං රැකියාව පත් කර ගත හැකි බව අවබෝධ කර ගත හැකිය.

ප්‍රමුඛ පද - ග්‍රාමීය දරිද්‍රතාව,ග්‍රාමීය ආර්ථික සංවර්ධනයක්, ස්වයං රැකියා, සමාජ ආර්ථික තොරතුරු, ජීවන තත්වය.

*1 ආර්ථිකවිද්‍යාව, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2 මහාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*